ih¨u yñlï weúßK
*All Rights Reserved*

# මධ්‍ය වාර පරීක්ෂණය 2015

# කතෝලික ධර්මය

**7 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

**I - කොටස**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සත්‍යතාවයේ ආත්මයාණන් යනු,

(1) පුත්‍රයාණන් වහන්සේ (2) පියාණන් වහන්සේ

(3) ශුද්ධාත්මයාණන් වහන්සේ (4) ශුද්ධෝත්තම පාප් වහන්සේ

02 ශුද්ධ වූ සභාව ආරම්භ වූ දවස වන්නේ,

(1) පෙන්තකොස්ත දිනයයි. (2) පාස්කු දිනයයි.

(3) නත්තල් දිනයයි. (4) ස්වර්ගාරෝහණ දිනයයි.

03 ශුද්ධ වූ ත්‍රිත්වය යනු

(1) පියාණන් වහන්සේ, පුත්‍රයාණන් වහන්සේ සහ ශුද්ධෝත්තම පාප් වාහන්සේ

(2) පියාණන් වහන්සේ, පුත්‍රයාණන් වහන්සේ සහ ශුද්ධාත්මයාණන් වහන්සේ

(3) පුත්‍රයාණන් වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ සහ පේදුරුතුමා

(4) ජේසුස් වහන්සේ, මරියතුමිය සහ ජුසේතුමා

04 පැවිදි / පූජකවරුන්ට ලබාදෙන ව්‍රේදහාර තුන වන්නේ,

(1) දිළිඳුකම, සාංඝික ජීවිතය, බැහැපත්කම

(2) කීකරුකම, බැහැපත්කම, විශ්වාසවන්තකම

(3) ව්‍රත ශුද්ධිය, කීකරුකම, යාච්ඤාවේ ජීවිතය

(4) කීකරුකම, දිළිඳුකම, ව්‍රත ශුද්ධිය

05 මාංශගතවීමේ අභිරහස යනු

(1) දේව පුත්‍රයා මරියතුමියගේ කුස තුළ පිළිසිඳ ගැනීම

(2) මස් අනුභව කිරීම

(3) දේව දූතයා මරියතුමියට මංගලම් කීම

(4) දාවිත්ගේ සිංහාසනය ක්‍රිස්තුන් වහන්සේට උරුම වීම

06 ''මෙසියස්'' යන නමෙහි අර්ථය වන්නේ,

(1) අභිෂේක කරනු ලැබූ තැනැත්තා (2) ගලවා ගනු ලැබූ තැනැත්තා

(3) ජය ලබාගත් තැනැත්තා (4) විශේෂ කැඳවීමක් ලැබූ තැනැත්තා

07 වාසනාවත් කල්හිද, අවාසනාවත් කල්හිද, ලෙඩ දුකේදී හා සුව සැපේදී ද ආදරයෙන්, ගෞරවයෙන් ජීවත්වීමට පොරොන්දු දෙන ප්‍රසාද නිධානය වන්නේ,

(1) අභිවෘද්ධි ආලේපය (2) ප්‍රසාද ස්නාපනය

(3) ආශිර්වාදකාර බන්ධනය (4) සමගි සන්ධානය

08 කානික්ක මංගල්‍යය සමරනු ලබන්නේ ................................................................ වන දින දීය.

(1) ජනවාරි 6 (2) ජූලි 8 (3) අගෝස්තු 15 (4) පෙබරවාරි 2

09 ජන්ම පාපයට සමාව ලැබී අපට නව ජීවනයක් ලැබෙන්නේ,

(1) අභිවෘද්ධි ආලේපය ප්‍රසාද නිධානය මගිනි.

(2) පූජකවරය ප්‍රසාද නිධානය මගිනි.

(3) ආශිර්වාදකාර බන්ධනය ප්‍රසාද නිධානය මගිනි.

(4) ප්‍රසාද ස්නාපනය ප්‍රසාද නිධානය මගිනි.

10 ශුද්ධාත්මයාණන් වහන්සේ නිරූපණය කරන සංකේතය නොවන්නේ,

(1) සුළඟ (2) දේදුන්න (3) ගින්දර (4) ජරවියා

11 සර්පයා හා තහනම් ගෙඩිය තුළින් සංකේතවත් වන්නේ,

(1) දේව ආදරය (2) එකමුතු බව

(3) පාපයේ ස්වභාවය (4) ආහාර හා සතුන්

12 පොළවේ දූවිල්ලෙන් මවන ලද මිනිසා ජීවමාන වූයේ,

(1) කොළ අතු ඇඳගැනීමෙන් පසුවය.

(2) නාස්පුඩු තුළට ජීවන හුස්ම හෙළීමෙන් පසුවය.

(3) ඇපල් ගෙඩිය කා පාපයට වැටුණු පසුවය.

(4) අහස හා පොළොව මැවූ පසුවය.

13 ජුදා සංස්කෘතියට අනුව ''සිහි කිරීම'' යනු

(1) ස්තුති කිරීමකි. (2) යාග කිරීමකි.

(3) නැවත සිදුකිරීමකි. (4) ආපසු ගැනීමකි.

14 නිල පූජකවරය නමැති ප්‍රසාද නිධානය ක්‍රිස්තුස් වහන්සේ විසින් ස්ථාපිත කරන ලද්දේ,

(1) මහ බ්‍රහස්පතින්දා රාත්‍රී භෝජන සංග්‍රහයේ දී

(2) ගොබ් ඉරිදා ජෙරුසලම් දේව මන්දිරයේ දී

(3) මහ සිකුරාදා කුරුස ගසේ දී

(4) බෞතීස්ම ස්නාපනය ලබන විටදී

15 ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන් ද, දෙවියන් වහන්සේගෙන් හා මිනිසුන්ගෙන් ප්‍රසාද ලබමින් වැඩුණු සේක. ජේසුස් වහන්සේගේ බාල කාලය පිළිබඳ මෙසේ ප්‍රකාශ කර ඇත්තේ,

(1) ශුද්ධ වූ මතෙව් තුමාය (2) ශුද්ධ වූ ලූක් තුමාය

(3) ශුද්ධ වූ මාක් තුමාය (4) ශුද්ධ වූ ජොහාන් තුමාය

16 වර්තමාන ශුද්ධ වූ සභාවේ දෘෂ්‍යමාන නායකයා වන්නේ,

(1) දෙවන ජුවාම් පාවුළු පාප්වහන්සේ (2) 4 වන පාවුළු පාප් වහන්සේ

(3) 16 වෙනි බෙනඩික් පාප් වහන්සේ (4) පළමුවැනි ෆ්‍රැන්සිස් පාප් වහන්සේ

17 පූජකවරය කොටස් කීයකට බෙදා දැක්විය හැකිද?

(1) පහයි. (2) දෙකයි. (3) හයයි. (4) තුනයි.

18 පරිසිවරුන්ගේ ප්‍රධානියා ද, ජුදෙව්වන්ගේ ප්‍රධානියා ද වන්නේ මොහුය.

(1) පාවුළු (2) යුදාස් (3) නිකදේමුස් (4) සකෙවුස්

19 ශුද්ධාත්මයාණෝ අපට දානය කරන ප්‍රධාන ධර්මතා ගුණ වන්නේ,

(1) විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රේමය (2) ආදරය, කරුණාව, දයාව

(3) පරිත්‍යාගය, සමාදානය, ආදරය (4) ප්‍රේමය, ව්‍රත ශුද්ධිය, කරුණාව

The National e-learning Portal for the General Education

20 (වනවාසී) තාපස දිවියේ පුරෝගාමියා ලෙස අප හඳුන්වනුලබන්නේ මෙතුමාවය.

(1) ජුසේවාස් පියතුමා (2) ස්නාවක ජුවාම්තුමා

(3) ශාන්ත අන්තෝනි තුමා (4) සකරියස් තුමා

21 ජේසුස් වහන්සේ බෞතීස්ම ස්නාපනය ලැබුයේ ........................................... නදියේ දී ය.

(1) නයිල් (2) ගංගා නම් (3) මහවැලි (4) ජොර්දාන්

22 පූජකවරය නමැති ප්‍රසාද නිධානය දානය කරනු ලබන්නේ,

(1) පියතුමාය (2) සහෝදරතුමාය

(3) රදගුරුතුමාය (4) මින් කිසිවකු නොවේ.

23 ජේදුරු යන නමෙහි අර්ථය වන්නේ,

(1) අහස (2) පර්වතය (3) වෘක්ෂය (4) මාර්ගය

24 ''යමෙකු වතුරෙන් ද, ආත්මයාණන්ගෙන් ද, නැවත නූපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැකිය.'' ජේසුස් වහන්සේ මෙලෙස පැවසුවේ,

(1) නිකදේමුස්ට (2) කොර්නේලියස්ට (3) සකෙවුස්ට (4) යායිරස්ට

25 පූජාප්‍රසාදිතුමා ඉටුකරන කාර්යයන්ගෙන් ප්‍රධාන කාර්යය වන්නේ,

(1) ප්‍රසාද නිධාන දානය කිරීම. (2) සමිති සමාගමේ මෙහෙයවීම.

(3) දිව්‍ය පූජාව පැවැත්වීම.(4) දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව පැවැත්වීම.

26 ශුද්ධ වූ බයිබලයේ මිනිසා මැවීම ගැන කතා සඳහන් වන්නේ,

(1) නික්මයාම පොතේය (2) ද්විතීයිය නීති සංග්‍රහයේය

(3) ගණන් කථාවෙහිය (4) උත්පත්ති පොතේය

27 ජේසුස් වහන්සේ පියාණන්ට ප්‍රසන්න වූයේ,

(1) ප්‍රාතිහාර්යයන් සිදුකරමින් බොහෝ රෝගීන් සුවපත් කළ නිසාය.

(2) ලෞකික දේට වහල් නොවී සරල චාම් ජීවිතයක් ගතකරමින් සේවය කළ නිසාය.

(3) පියාණන් පැවරූ ගැළවීමේ කාර්යය වගකීමෙන් යුතුව ඉටුකළ නිසාය.

(4) ජනතාවගේ ප්‍රසාදය දිනාගනිමින් දේව වචනය දේශනා කළ නිසාය.

28 ''මම දිව්‍ය සත්ප්‍රසාද ලබාගැනීමේ දී ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ හා සමග සම්බන්ධ වෙමි'' යනුවෙන් ප්‍රකාශ කළේ,

(1) ශාන්ත බැසිල් තුමා (2) ශාන්ත ජෙරොම් තුමා

(3) ශාන්ත පාවුළු තුමා (4) ශාන්ත සිරිල් තුමා

29 යහපත් කිතුණු දරුවකු ලෙස ඔබ පාසලේ දී

(1) ක්‍රිස්තු ගුණාංග පෙන්වමින් ආදර්ශවත්ව හැසිරිය යුතුය.

(2) ගුරුවරුන්ගේ හා සිසුන්ගේ හිත දිනාගත යුතුය.

(3) ප්‍රියමනාප ලෙස කථා කළ යුතුය.

(4) සියලු යහළු යෙහෙළියන්ට ආදරයෙන් සැලකිය යුතුය.

30 වහල්කම් නිවාසය ලෙස හැඳින්වෙන්නේ,

(1) රෝමය (2) මිසරය (3) කානාන් (4) පලස්තීනය

- ප්‍රශ්න අංක 31 - 35 දක්වා වූ ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.

31 ස්නාවක ජොහාන් තපස්වරයෙකි. ( )

32 පාරාවෝ රජතුමා ඊශ්‍රායෙල් ජනතාවට ඉතා ආදරය කළ රජතුමෙකි. ( )

33 අපෝස්තුළුවරු ශුද්ධාත්ම බලයෙන් පූර්ණ වී නොබියව දේශනා කළහ. ( )

34 යෙසායා යනු ආදිපිතෘවරුන්ගෙන් එක් අයෙකි. ( )

35 කිතුනු විවාහය ප්‍රසාද නිධානයක් වන්නේ ය. ( )

- නිවැරදි වචනය යොදා හිස්තැන් පුරවන්න.

36 දේව රාජ්‍යය වෙනුවෙන් සේවය කිරීමට ............................................................ ලබා ඇත.

37 දාවිත් ආලේප කරනු ලැබුයේ ............................................................ ය.

38 පුරාණ ගිවිසුමෙහි ............................................................ අභිෂේක කරනු ලැබූ සේක.

39 අපෝස්තුළුවරුන් වෙත ශුද්ධාත්මයාණන් වැඩම කළේ ............................................................

40 ලෝකය වැඩි දියුණු කිරීමට ............................................................ පැවරූ සේක.

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01 (1) ශුද්ධාත්ම දීමනා 2 ක් ලියන්න.

(2) ඔබ ශුද්ධාත්ම මාලිගයක් බවට පත්වූයේ කවදාද?

(3) රූප වන්දනාව යනු කුමක් ද?

(4) මිථ්‍යා ඇදහිලි පසුපස යන අයට දිය හැකි අවවාද 2 ක් ලියන්න.

(5) දස පනතේ තුන්වන පනත ලියන්න. (2 x 5 = 10)

02 (1) පූජාප්‍රසාදි තුමා ඉටුකරන කාර්යයන් 3 ක් ලියන්න.

(2) අන්තිමරාත්‍රී භෝජන අවස්ථාවේ කිතුතුමා පූප හා මිදියුෂ ගෙන තුති පුදා ගෝලයන්ට දෙමින් පැවසූ වදන් මොනවා ද?

03 (1) ඔබේ මීසමේ සේවය කරන පැවිදි නිකායයන් 3 ක් නම් කරන්න.

(2) එම තාපස / තාපසිකාවන් බැදෙන වේදභාර තුන නම් කරන්න.

(3) ඔබ සතු විශේෂ දක්ෂතා / හැකියා තුනක් ලියන්න.

04 (1) පවුලක් තුළ පැවතිය යුතු යහපත් ගුණාංග 5 ක් ලියන්න.

(2) කිතුනු පවුලක දෙමාපියන්ට පැවරෙන වගකීම් 3 ක් ලියන්න.

05 (1) පෙන්තකොස්ත දින ශුද්ධාත්ම ආගමනය කෙටියෙන් විස්තර කරන්න.

(2) ශුද්ධාත්ම බලයෙන් පිරි කටයුතු කිරීමේ දී ඔබට මුහුණ දෙන්නට සිදුවන බාධක 2 ක් ලියන්න.

06 (1) ආශිර්වාදකාර බන්ධනය නමැති ප්‍රසාද නිධානය ගැන කෙටියෙන් හඳුන්වන්න.

(2) නාසරතයේ ශුද්ධ වූ පවුලෙන් අපට ගතහැකි ආදර්ශ මොනවා ද?

(3) ඔබ ඔබේ නිවස තුළදී අන් අයට ආදර්ශමත් ලෙස ජීවත්වන්නේ කෙසේද?

07 (1) අපි අප අවට පරිසරය රැකගන්නේ කෙසේද?

(2) සොබාදහම විනාශ වීමට හේතු මොනවා ද?